LIRNEasia

Pro-poor. Pro-market.

www.lirneasia.net

# ජාලගත මෙවලම්, නාගරික ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ව්‍යවසායන් ගේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව සහ ව්‍යාපාර වර්ධනයට හේතු වේ

ප්‍රවෘත්ති නිවේදනය

ලාංකිකයින් අතරින් ඉතා විශාල ප්‍රතිශතයකට කිසියම් ආකාර වූ ජාලගත මෙවලමක හිමිකාරිත්වය ඇති අතර නාගරික ප්‍රදේශ වල මෙම තත්වය ඉතා ඉහළ මට්ටමක පවතී. 2013 වර්ෂය වනවිට නාගරික කුටුම්භයන් ගෙන් සියයට 93 ක දුරකතන පැවතිනි (HIES, 2012/2013); අද වන විට මෙම ප්‍රතිශතය මීට වඩා වැඩිවීමට ඉඩ ඇත. නාගරික ජනගහනයෙන් සියයට 40 ක ට ආසන්න සංඛ්‍යාවකට, 2015 වසර මැද ගණන් බැලීමකට අනුව, පරිගණයක් භාවිත කිරීමේ හැකියාව ඇති බව කියැවේ. රටේ දැනට ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් සංඛ්‍යාව පිළිබඳ නිවැරදි සංඛ්‍යාවන් දැක්විය නොහැකි වුවත් රටේ රැකියා නියුක්තියෙන් සියයට 35 ක් ස්වයං රැකියාවක් කරන බව හෝ සේවායෝජකයකු බව වාර්තා වේ (2015, ශ්‍රම හමුදා සමීක්ෂණය). රැකියා නිර්මාණය සහ ආර්ථික වර්ධනය කෙරෙහි ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් තුලින් සැලකිය යුතු දායකත්වයක් ලැබේ.

ජාලගත මෙවලම් භාවිතයේ බලපෑම තවමත් එතරම් පැහැදිළි නැත. ජාලගත මෙවලම් තුලින් ව්‍යාපාර වලට අදාල තොරතුරු ලබා ගැනීමට හැකිවීම, අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවල, නාගරිකව ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ව්‍යවසායයන් ගේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සාධක වන්නේ දැයි සොයා බැලීම පිණිස දැනට සිදුකර ඇති පර්යේෂණයන් ක්‍රමානුකූල සමීක්ෂණයකට ලක් කරන ලැබිනි.

## ප්‍රධානතම සොයා ගැනීම්

1. ජාලගත මෙවලම් සතුවීම සහ භාවිත කිරීම අභ්‍යන්තර කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට හේතු වේ: ව්‍යාපාරයට සම්බන්ධ ඇමතුම් ගැනීම වැඩිවන ප්‍රමාණයත් සමගම කළමනාකරන ව්‍යවහාරයන් පිළිබඳව වඩා හොද තොරතුරු ලැබේ, සේවක ඵලදායීතාවය ඉහළ යයි, ආයතනික සහ මෙහෙයුම් කාර්යසාධනය දියුණුවේ.
2. ජාලගත මෙවලම් භාවිතයෙන් ව්‍යාපාරය වැඩි වර්ධනයක් අත් කර ගැනීම, නිෂ්පාදන වලට වැඩි වෙළඳපලක් හිමි වීම, ආදායම සහ ලාභය ඉහළ යාම වැනි ප්‍රතිපල ඇති කරයි.

## පර්යේෂණය

### ක්‍රමානුකූල අධ්‍යයනය සම්බන්ධ කරුණු

නිශ්චිත ක්‍රමවේදයන් යොදා ගනිමින්, පැහැදිළිව අර්ථකතනය කරන ලද පර්යේෂණ ගැටළුවකට අදාල ක්‍රමවේදී වශයෙන් ශක්තිමත් සාධක හඳුනා ගැනීම, තෝරා ගැනීම සහ විචාරාත්මක අගැයීමකට ලක්කිරීමට ක්‍රමානුකූල අධ්‍යයනයක දී සිදු කෙරේ.

මෙම ක්‍රමානුකූල සමාලෝචනය සඳහා අධ්‍යයනයන් 24,204 ක් පරීක්ෂා කරන ලද අතර පර්යේෂණයට එක් කිරීම සඳහා වඩාත්ම ශක්තිමත් ප්‍රමාණාත්මක අධ්‍යයනයන් තෝරා ගන්නා ලදී. බොහෝ අධ්‍යයනයන්හි අවධානය යොමු කර තිබූ ජාලගත මෙවලම ජංගම දුරකතනයයි.

### අභ්‍යන්තර කාර්යක්ෂමතාවය මත සිදුවන බලපෑම්

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ලබා ගැනීම සහ භාවිත කිරීම සේවක ඵලදායිතාවයට සිදු කරන බලපෑම අප්‍රිකානු රටවල් 13 ක ක්ෂුද්‍ර ව්‍යවසායයන් 3,691 ක් සම්බන්ධයෙන් කරන ලද සමීක්ෂණයකින් පෙන්වා දී ඇත. ව්‍යාපාරයක, ආයතනික සහ මෙහෙයුම් කාර්යසාධනයන් ඉහළ නැංවීමට විද්‍යුත් වාණිජ්‍ය යෙදුම් භාවිතා කිරීම උපකාරී වූ ආකාරය විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) සම්බන්ධව කරන ලද අධ්‍යයනයන් දෙකක් තුලින් පැහැදිලිවී තිබේ. ඒ හැරුණු විට, තොරතුරු තාක්ෂණ මෙවලම් භාවිතා කර වඩා හොඳින් දැනුම කළමනාකරනය කරන බව ද පෙනී ගොස් ඇත. ජංගම දුරකතනයක හිමිකාරිත්වය තිබීම නිසා වැඩි ව්‍යාපාරික ඇමතුම් සංඛ්‍යාවක් ගැනීමට හැකිවන අතර එමගින් ක්ෂුද්‍ර ව්‍යවසායකයන් ගේ ව්‍යාපාරික සම්බන්ධතා ජාලයන් පුළුල් වන බව රුවන්ඩාවේ සිදු කරන ලද ලද සමීක්ෂණයකින් හෙළි වී ඇත.

### ව්‍යාපාරයේ වර්ධනය මත සිදු කරන බලපෑම

කෙන්යාවේ සහ ටැන්සානියාවේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් 100 ක් සම්බන්ධව කරන ලද සමීක්ෂණයකින් දකින්නට ලැබුනේ, ව්‍යාපාරය සඳහා ජංගම දුරකතන භාවිතා කිරීම, ආදායම, පාරිභෝගික පදනම පුළුල්වීම සහ ලාභය යන අංශ වලින් එම ව්‍යපාර තුල වර්ධනයක් පෙන්වීමට හේතු වූ බවයි. ඉන්දියාවේ කරන ලද අධ්‍යයනයකින්, දුරකතන භාවිතය ඇරඹීම සහ ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය වීම අතර නෛවසරක පමණ කාල අන්තරයක් ඇති බව පෙන්වනු ලැබිනි.

තොරතුරු තාක්ෂණය ලබා ගැනීමේ අවස්ථාව තිබීම ව්‍යාපාරයේ වර්ධනය මත ඇති කරන ලද්දේ සුළු බලපෑමක් පමණක් බව මුම්බායි නගරයේ කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසායකයින් පිළිබඳව කරන ලද සමීක්ෂණයකින් පෙන්වූ ප්‍රතිපලය විය. ජංගම දුරකතන ඔස්සේ මුදල් ගනුදෙනු කිරීම, ක්ෂුද්‍ර ව්‍යවසායකයින් ගේ ලාභ ඉතා සුළු වශයෙන් ඉහළ නැංවීමට සාධක විය. විද්‍යුත් වාණිජ යෙදුම් භාවිතය අභ්‍යන්තර කාර්යක්ෂමතාවය වැඩි කිරීමට පමණක් නොව නිෂ්පාදනයන්ට වැඩි වෙළඳපළක් හිමිවීම (වෙළඳපළ භාගය පුළුල් කිරීම) ට ද හේතුවන බව පැහැදිලි විය.

## නිගමන

ව්‍යාපාරික තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා භාවිත කෙරන ජාලගත මෙවලම්, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ගේ අභ්‍යන්තර කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම කෙරෙහි සාධනීය බලපෑමක් සිදු කරන බව සමාලෝචනය තුලින් හෙළි විය. කෙසේවෙතත්, සංඛ්‍යානන වශයෙන් සලකා බැලූ විට මේ බලපෑම ඉතා සුළු ය.

## ස්තුතිය

"ජාලගත මෙවලම් තුලින් ව්‍යාපාරයට අදාල තොරතුරු ලබා ගැනීමට අවස්ථාව තිබීම, අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවල, නාගරිකව ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායන් ගේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව සහ ව්‍යාපාර වර්ධනයට හේතු වන්නේ ද?" යන ක්‍රමානුකූල සමාලෝචනය සිදු කරන ලද්දේ කැනඩාවේ, ඔටාවා හි ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ (IDRC) සහ එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන දෙපාර්තමේන්තුවේ සහායයෙනි.

## කතෘත්වය

ලර්න්ඒෂියා ආයතනය වෙනුවෙන් පර්යේෂණය සිදු කරන ලද්දේ ආචාර්ය පී විග්නේස්වර ඉලවරසන් විසිනි.
evignesh@gmail.com